IHRA
UNIVERSITY OF COLOMBO

000017

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2017/2018

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජනවාරි)

## BLE 302 - ජනගහන අධ්‍යයනය සහ මිනිස්බල සැලසුම්කරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1) ජනගහන අධ්‍යනයය යනු කුමක්දැයි පැහැදිලිකර ජනගහන පිලිබඳ දත්ත රටක සංවර්ධන සැලසුම් සඳහා යොදාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

2)

I. ජනගහනය වෙනස්වීම කෙරෙහි (Population Change) බලපාන නිශ්චායක (components) සාකච්ජා කරන්න.

(ලකුණු 10)

II. ප්‍රජා විද්‍යාසංක්‍රාන්ති න්‍යායට (Demographic Transition Model) අනුව ජනගහන වර්ධනයේ විවිධ අවදීන්හි දැකිය හැකි ලක්ෂණ පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

3) "රටක මර්ත්‍යතා දර්ශක එහි සමාජ සංවර්ධනය පිලිබඳ කැඩපතකි." මෙම කියමන සුදුසු උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 20)

4) ශ්‍රී ලංකාවේ සඵලතා සංක්‍රාන්තිය කෙරෙහි බලපෑ සාධක උදාහරණ සහිතව සාකච්ජා කරන්න.

(ලකුණු 20)

5) සංක්‍රමණ වර්ග පැහැදිලි කර සංක්‍රමණය සඳහා තල්ලුකිරීමේ සහ ඇදගැනීමේ සාධක කොතෙක් දුරට වැදගත් වන්නේදැයි ශ්‍රී ලංකාව ඇසුරෙන් විමසන්න.

(ලකුණු 20)

6) පහත සංකල්ප කෙටියෙන් විස්තර කරන්න.

I. බාල යැපුම් අනුපාතිකය (Younger Dependency Ratio) සහ වයස්ගත යැපුම් අනුපාතිකය (Old -age Dependency Ratio)

II. දළ උපත් අනුපාතිකය (Crude Birth Rate) සහ මුළු සාඵල්‍යතා අනුපාතිකය (Total Fertility Rate)

III. ජනසංගණන (Population Censuses) සහ නියැදි සමීක්ෂණ (Sample Surveys)

IV. ජනගහන අධ්‍යනයය (Population Studies) සහ ප්‍රජා විද්‍යාව (Demography)

(මුළු ලකුණු 5X4 = 20)

7) ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනයේ ලක්ෂණ සහ වියපත් ජනගහනය ඉහළයාම හේතුකොටගෙන ඇතිවිය හැකි ගැටළු කවරේදැයි විමසන්න.

(ලකුණු 20)

8) පහත සඳහන් සංකල්ප හයෙන් (06) ඕනෑම හතරක් (04) පිලිබඳ කෙටි සටහන් ලියන්න.

I. ජනගහන පිරමීඩ (Population Pyramid)
II. ජිවන අපේක්ෂාව (Life Expectancy)
III. ශ්‍රම සංක්‍රමණ (Labour Migration)
IV. ජනගහන වර්ධනය (Population Growth)
V. සේවා වියුක්තිය (Unemployment)
VI. ලෝක පද්ධති න්‍යාය (World – System Theory)

(මුළු ලකුණු 5X4 = 20)

******